සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/04/LH/06/2024 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ................ | දිනය<br>திகதி<br>Date 2024.03.20 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක 2024/07**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම මුලස්ථාන , කලාප, ව්‍යාපෘති කළමණාකරුවන් හා බැංකු සමිති කළමණාකරුවන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් - 2024**

## 01. හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ සහනාධාර ලබාදීමේ කටයුතු 2023 වර්ෂයේ සිට සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය වෙත පවරා ඇත. ඒ අනුව කාණ්ඩ 4 ක් යටතේ පවුල් ලක්ෂ 20 සෘජුවම සහනාධාරලාභීන් ලෙස හඳුනාගෙන ඇති අතර මෙම ප්‍රතිලාභී පවුල් අතරින් ලක්ෂ 12 වසර 3 ක් තුළ සවිබල ගැන්විමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඊට ආදාල සියලු උපදෙස් දැනටමත් සමෘද්ධි චක්‍රලේඛ අංක 2024/02 දරණ “අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන 2024” චක්‍රලේඛය මගින් නිකුත් කර ඇත.

එකී චක්‍රලේඛ උපදෙස් අනුව අස්වැසුම ප්‍රතිලාභී පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ වගකීම ජීවනෝපාය සංවර්ධන අංශයේ කාර්යභාරයක් වන අතර ඒ සඳහා 2024 වර්ෂයට සීමිත භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණයක් ජීවනෝපාය සංවර්ධන අංශයට වෙන් ව ඇත. මෙම ප්‍රතිපාදන යොදාගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දී ආසියානු සංවර්ධන බැංකුව යටතේ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇති වසම් හා නව සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා විසිරුණු ව්‍යාපෘති වැඩසටහන සඳහා තෝරාගෙන ඇති වසම් වලින් බැහැරව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට හැකිතාක් කටයුතු කල යුතුය . ඒමෙන්ම අස්වැසුම ප්‍රතිලාභින් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රතිපාදන භාවිතා කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හුදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා වෙනුවට නිශ්චිතවම හඳුනාගන්නා ප්‍රතිලාභින් සවිබල ගැන්වීමේ විභවතාවය ඉහල මට්ටමක පැවැතිම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම කෘෂි හා සත්ත්ව පාලන ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී පහත සඳහන් මෙම චක්‍රලේඛයේ උපදෙස් හා මඟපෙන්වීම් උපයෝගී කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

| | Director General | Additional Director General (Admin & Establishment) | Chief Accountant | Director ( Micro Finance) | Office |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர் | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி ) | කාර්යාලය<br>அலுவலகம் |
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

## 02. අරමුණු

I. ප්‍රතිලාභී පවුලේ මාසික ආදායම රුපියල් 30.000 දක්වා ඉහල නැංවීම.
II. නිෂ්පාදනය සඳහා පවතින වෙළෙඳපොල අවස්ථා පුළුල් කිරීම
III. කෘෂි, සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති දිරිමත් කිරීම තුලින් ජාතික නිෂ්පාදනය ඉහල නැංවීම.
IV. පරිසර හිතකාමී ජීවන රටාව තුලින් සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවන් බිහිකිරීම

## 03. ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි ක්ෂේත්‍ර

I. සුහුරු කෘෂිකර්මාන්තය පදනම් කරගත් බෝග නිෂ්පාදන ව්‍යාපෘතීන්(smart Agriculture)
II. පශු සම්පත් හා සත්ත්වපාලන ව්‍යාපෘතින්
III. ධීවර හා ජලජීවී ව්‍යාපෘති
IV. කෘෂි ආශ්‍රිත කුඩා හා ප්‍රාථමික කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතීන්
V. අගය එකතු කළ නිෂ්පාදන ව්‍යාපෘතීන් **ඇමුණුම් 01**

## 04 ප්‍රතිලාභින් හඳුනා ගැනීම

I. අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් ප්‍රතිලාභි පවුලක සමාජීයෙකු වීම
II. ව්‍යාපෘතිලාභීයා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට හැකි ඉහල ශක්‍යතාවයක් සහිත පුද්ගලයෙකු වීම
III. කාන්තා මූලික ව්‍යවසායකයින් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබාදීම
IV. ව්‍යාපෘතිලාභියා හෝ පවුලේ සමාජිකයෙකු ප්‍රජාමූල සංවිධානයේ සමාජියෙකු වීම

## 05. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

I. ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහයෙන් කර්මාන්ත සේවා කාර්යංශය මගින් සිදුකරන ,ලද වෙළඳපල විශ්ලේෂණයෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති විභවතායන් කෙරෙහි අවධානය යොමු කර ව්‍යාපෘති හඳුනා ගැනීම.
II. පවුල් ඒකක පදනම් කරගෙන සිදුකරන පවුල් සංවර්ධන සැලස්මෙන් මතුවන ජීවනෝපාය අවස්ථා වලින් වඩාත්ම ප්‍රශස්ථ ව්‍යාපෘතිය හඳුනා ගැනීම .
III. හඳුනාගත් ජීවනෝපාය ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කළමනාකරුගේ මඟ පෙන්වීමෙන් වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම **ඇමුණුම 02**
IV. ව්‍යාපෘතිය අදාල ක්ෂේත්‍රයේ රේඛිය ආයතන නිළධාරින්ගේ තාක්ෂණික සහාය උපදෙස් හා නිර්දේශ ලබා ගැනීම

V. එක් පවුල් ඒකක සඳහා සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් සකස් කරනු ලබන ව්‍යාපෘති වාර්තාව ව්‍යාපෘති කළමනාකරු විසින් පරික්ෂා කර බලා අදාල තාක්ෂණික සේවා නිලධාරීන්ගේ නිර්දේශයෙන්, ප්‍රාදේශිය ලේකම් අනුමැතියෙන් පසුව අනුව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යොමු කිරිම

VI. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් සියලු ප්‍රාදේශිය කොට්ඨාශ වල ව්‍යාපෘති වාර්තා පරීක්ෂා කර අනුමත කර **ඇමුණුම් 03**ට අනුව සාරාංශ කර වාර්තා කර jeevonopaya@gmail.com ලිපිනයට 2024.04.20 දිනට පෙර ලබාදිය යුතුය.

## 06. ප්‍රතිපාදන වෙන් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීම

I. සවිබල ගැන්වීම සඳහා හඳුනා ගන්නා ලද එක් අස්වැසුම ප්‍රතිලාභියෙකු වෙනුවෙන් ලබාදිය හැකි උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රුපියල් 100,000 කි.

II. ව්‍යාපෘති වටිනාකමින් 50%කි දෙපාර්තමේන්තු දායකත්වයක් විය යුතු අතර ප්‍රතිලාභී දායකත්වය 50% කට නොඅඩු විය යුතුය

III. ව්‍යාපෘතියේ කාරක ප්‍රාග්ධනය ලෙස ඊට වඩා වැඩි මුදලක් වැය වන්නේ නම් සමෘද්ධි ප්‍රජාමුල බැංකුවෙන් , ජීවනෝපාය චක්‍රිය ණය අරමුදලෙන් ණය ලබා ගැනීමේ හැකියාව ඇති අතර ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් අනුව ලබා දිය යුතු ණය මුදල තිරණය කල යුතුය.

IV. සකස් කරනු ලබන ව්‍යාපෘති වාර්තාව අනුව ලබාදෙන ප්‍රතිපාදන තිරණ කළ යුතු අතර කිසිම අවස්ථාවක ප්‍රතිලාභියා වෙත මූල්‍යමය ආධාර ලබා නොදිය යුතුය.

V. රජයේ ප්‍රතිපාදන මගින් ලබාදෙන යෙදවුම් තම නිෂ්පාදන කාර්යයන් සඳහා පමණක්ම යොදාගන්නා බවට අදාල ව්‍යාපෘතිලාභියා, තම කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් සමඟ **ඇමුණුම් 04** හී පරිදි ගිවිසුම්ගත විය යුතුය.

VI. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජය විසින් අනුමත ප්‍රසම්පාදන, මුදල් රෙගුලාසි, මෙම චක්‍රලේඛ උපදෙස් හා වෙනත් අදාළ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතු අතර, සම්මත මිල ගණන්ද සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීම අත්‍යවශ්‍ය වේ.

VII. මෙලෙස හඳුනාගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්ක වෙන් කළ ප්‍රතිපාදන **ඇමුණුම් 05**න් දැක්වේ.

## 07. පරිපාලන වියදම

මෙම වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුවෙන් දරණ ලද වියදමින් 0.3%ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ද 1%ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ද පරිපාලන වියදම් ලෙස වෙන් කර ගැනීමට හැකියාව ඇත.

## 08. අධීක්ෂණය, මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය

I. ව්‍යාපෘතිලාභින් නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව අදාල නිළධාරින් මසකට වරක් රැස්වී ප්‍රගතිය සමාලෝචනය කල යුතුය.

II. මූලස්ථාන කළමනාකරු, අදාල සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමනාකරු.ව්‍යාපෘති කළමනාකරු, සංවර්ධන නිලධාරි (අලෙවි), සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු, ව්‍යාපෘති සහකාර සමගින් අදාළ වසම් භාරව රාජකාරි කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ නිරන්තර අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය.

III. ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින්ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් සකස් කල යුතුය.

IV. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී මෙම වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කල යුතුය.

V. ව්‍යාපෘති ආරම්භ කළ පසුව, ප්‍රගතිය ලබාදීමටත්, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි වන පරිදි ප්‍රගතිය යාවත්කාලීන කර තබා ගැනීමටත් කටයුතු කල යුතු ය.

VI. ව්‍යාපෘතිලාභීන් වෙත ලබාදෙන යෙදවුම් (ප්‍රාග්ධන භාණ්ඩ, සතුන්, රෝපණ ද්‍රව්‍ය හා වෙනත්) පිළිබඳව සවිස්තරාත්මක ලේඛණයක් අදාල සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ සහය ඇතිව ව්‍යාපෘති කළමනාකරු විසින් පවත්වාගත යුතුය.

මෙම චක්‍රලේඛ පිළිබඳ වැඩිදුර විස්තර ජීවනෝපාය සංවර්ධන අංශයේ දුරකථන අංක 0112-873801 හා jeevonopaya@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි. මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

එස්. සත්‍යසීලන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් — අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත් :

01. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
03. සභාපති, ජාතික සමෘද්ධි සමාජ සංවර්ධන අරමුදල - සියළුම ප්‍රාදේශීය සංවිධාන සභාපතිවරුන් දැනුවත් කිරීම සඳහා
04. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
06. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.